උතුරු පළාත් සභාව – 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු පළාත් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 16 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 දෙසැම්බර් 16 සිට 2046 දෙසැම්බර් 15 දක්වා වර්ෂ 30ක කාල පරිච්ඡේදය තුල කන්ඩාවලෙයි ප්‍රදේශයේ දීර්ඝකාලීන බදු පදනමින් ලබාදුන් රජයේ ඉඩම් සඳහා හිඟ බදුකුලී රු.4,212,000ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීමෙන් පළාත් සභාවේ හිඟ ආදායම් රු. 4,212,000කින් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියාගේ අදහස් ඇතුළත් කර ඉතිරි මුදල අයකර ගැනීමට උපදෙස් දී ඇත.	හිඟ කල්බදු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය

(ආ)	උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ වර්ග 06කට අයත් මූල්‍ය නොවන වත්කම් 21ක් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව අපහරණ කර තිබුණද ඒවායේ පිරිවැය මූල්‍ය නොවන වත්කම්වල වටිනාකමින් ඉවත් කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් සිදු කරන ලෙස උපදෙස් දී ඇත.	මූල්‍ය නොවන වත්කම්වල අගය නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අමාත්‍යාංශ 01ක් දෙපාර්තමේන්තු 10ක් සහ පළාත් ආයතන 03කින් සමාලෝචිත වර්ෂය දක්වා මූලධන වත්කම් මිලදී ගැනීම්, වැඩිදියුණු කිරීම් සහ හෙලිදරව් කිරීම්වලදී එම ආයතනවල මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් දැක්වීමෙන් පළාත් අරමුදලේ මූල්‍ය නොවන වත්කම් එකතුව රු. 488,513,648ක් අඩුවෙන් දක්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම්වලට අඩුවෙන් දක්වා ඇති වත්කම් ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.	මූල්‍ය නොවන වත්කම් වල අගය නිවැරදි කළ යුතුය.
(ඈ)	දෙපාර්තමේන්තු 05ක සහ පළාත් ආයතන 01ක මූලධන වත්කම් වර්ගීකරණ දෝෂ සහ ද්විගණනය කිරීම් දෝෂ හේතුවෙන් ඒවාහි මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම වැඩියෙන් දැක්වීමෙන් මූල්‍ය ප්‍රකාශවල මූල්‍ය නොවන වත්කම් එකතුව රු.81,582,470කින් වැඩියෙන් දක්වා තිබුණි.	දැන් නිවැරදි කර ඇත.	මූල්‍ය නොවන වත්කම් වල අගය නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ රු.1,110,730ක වටිනාතමක් වූ අළුත්වැඩියාවන්, රු.941,350ක වටිනාකමක් සහිත වූ වාහන අළුත්වැඩියා වියදම් සත්‍ය වශයෙන්ම දරන ලද බවට තහවුරු කිරීමේ සාක්ෂි ලෙස වවුචර් හා ගරාජ් බිල්පත්‍ර සහ රු.1,468,570ක සංග්‍රහ වියදම් සඳහා උත්සව විස්තර සහ සහභාගී වූවන්ගේ අත්සන් ආදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකිව පැවැතුණි.	පිළිතුරක් ලබා දී නැත.	ගෙවීම තහවුරු කිරීම සමඟ සනාථ කිරීමක් අමුණා තිබිය යුතුය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම, වංචාවක් ඇති වීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

	නීති, රීති, රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
(i)	IX පරිච්ඡේදයේ 2.2 වගන්තිය	ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) අරමුදල් ප්‍රතිපාදන යටතේ පවත්වා තිබූ පුහුණු පාඨමාලාවලට නිලධාරීන්ට සම්පත්දායක දීමනා ලෙස කම්කරු දෙපාර්තමේන්තුව විසින් රාජකාරි වේලාව තුළ ගෙවා තිබූ රු.1,032,000කින් සියයට 25ක් මුදලක් අයකර ඒකාබද්ධ අරමුදලට තැන්පත් කර නොතිබුණි.	ආයතන සංග්‍රහයේ වගන්තියට අනුකූලව කටයුතු කරන බව.	ආයතන සංග්‍රහයේ වගන්තියට අනුකූල විය යුතුය.
(ආ)	2016 අංක 1 දරන උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්ති			
	(i) 2 (උ) වගන්තිය	ජාතික ගමනාගමන මණ්ඩල සහ පෞද්ගලික ප්‍රවාහන අංශය අතර සාධාරණ තරඟයක් හා ඵලදායි මගී සේවාවක් ලබාදිය හැකි පරිදි විධිමත්	ධනාත්මක ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගත යුතුය.

		ඒකාබද්ධ බස් රථ කාල සටහනක් සකස් කිරීමේ විධිවිධාන සලසා නොතිබුණි.		
	(ii) 54 (2) වගන්තිය	බස් නැවතුම්පොළවල් හෝ නැවැතුම් ස්ථානවලින් බස් රථ ධාවනය සඳහා කාලසටහන් බලාත්මක කිරීමටත්, කාලසටහන් කළමනාකරණයට සම්බන්ධ කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීමටත් එවැනි කාර්ය මණ්ඩලයට උපදෙස් සහ මග පෙන්වීම් ලබා දීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.	කාලසටහන් සකස් කර ඇති අතර අහඹු පරීක්ෂණ කර නිලධාරීන් හරහා දඩ මුදල් එකතු කරනු ලැබේ.	අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
	(iii) 54 (3) වගන්තිය	කාලසටහන් කළමනාකරණයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කාර්ය මණ්ඩලය බඳවා ගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	කාර්ය මණ්ඩලය සමාලෝචනයක් කර අදාළ බඳවා ගැනීම් සඳහා පියවර ගත යුතුය.
(ඇ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය			
(i)	2.11.2 මාර්ගෝපදේශය	ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගැයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීම තහවුරු කිරිමට වෙනම පැමිණීමේ ලේඛනයක් සහා ලේකම් කාර්යාලයේ පවත්වාගෙන ගොස් නොතිබුණි.	වර්තමානයේ, ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ පැමිණීම තහවුරු කිරීම සඳහා වෙනම අයවැයක් පවත්වාගෙන යනු ලැබේ.	පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2.14.1 සහ 3.4(2) මාර්ගෝපදේශ	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ මුළු මාර්ග නඩත්තු කාර්යයන්වලින් සියයට 53ක් වූ රු. මිලියන 397ක වටිනාකමක් සහිත මාර්ග 35ක් යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල	නොවැම්බර් මස අවසානයේදී රුපියල් මිලියන 384 ක් ලැබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශය	ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට පියවර ගත යුතුය

		මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන් සඳහා වෙළෙඳපොල සැදෑහුම් ක්‍රියාවලිය මගින් දෙපාර්තමේන්තුවේ අභිමතය පරිදි තෝරාගත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ලබාගෙන මාර්ග නඩත්තු කාර්යයන් ප්‍රදානය කර තිබුණි.	2.14.1 හි 3.4 වගන්තියේ සඳහන් පරිදි අතීත කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින් මෙම කාර්යයන් ප්‍රදානය කරන ලදී.	
(ඈ)	උතුරු පළාත් සභාවේ මූල්‍ය රීති			
	70.5 රීතිය	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනතුරට ලක්වූ වාහනය සඳහා වූ විමර්ශන වාර්තාව වර්ෂයක් ඉකුත් වී තිබූ නමුත් එකී වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කරන ලද විමර්ශනය අවසන් කර නොමැති අතර වාර්තාව ලැබී නොමැත.	නියමිත කාලය තුළ විමර්ශන වාර්තාව ඉදිරිපත් කළ යුතුය
(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය	ආයතන 08ක වාහන 33ක් සඳහා ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.	නිවැරදි කිරීම සිදු කිරීමෙන් පසු ඉන්ධන සමාලෝචනයක් පවත්වනු ලැබේ.	ඉන්ධන පරීක්ෂාව සුදුසු කාල පරතරයන්හිදී සිදු කළ යුතුය
(ඊ)	2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 4.3 ඡේදය	ඉන්ධන ගෙවීම් ලදුපත් මත සිදුකරන ප්‍රතිපූරණය කිරීම් මගින් නොව, මාසිකව ගෙවිය යුතු බව සඳහන් කර තිබුණද, ආණ්ඩුකාර ලේකම් කාර්යාලයයීය වාහනයකට ඉන්ධන සැපයුම් නියෝගයක් මගින් ඉන්ධන පුරවන ලෙසට උපදෙස් ලබාදී මේ වන විටත් ඇණවුම් හරහා ඉන්ධන පිරවීම සිදුකර තිබුණි.	දැනට මාසික ගෙවීමක් ලෙස ගෙවනු ලැබේ.	චක්රලේඛයට අනුකූල විය යුතුය
(උ)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පැමිණීමේ ලේඛන හෝ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම් වලින් තොරව පළාත් ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික කාර්ය මණ්ඩලයට, 2024 වර්ෂයේදී අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි.	පිළිතුරක් ලබා දී නොමැත.	චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය.

(ඖ)	2020 අප්‍රේල් 30 දිනැති අංක PF/06/2015(ii) දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය	වෙළෙඳපොල සැදැහුම් ක්‍රියාවලිය මගින් භාණ්ඩ මිලදී ගැනීමේදි ප්‍රාදේශීය ආයතනවලට අධිකාරි බලය ලබාදී ඇති සීමාව රු. මිලියන 1ක් වුවද, එයට පටහැනිව වෙට්ටික්කුලම මූලික රෝහලට වියළි ආහාර සැපයීම සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	එය 2023 දී පැවැත්වුවද, අනාගතයේදී එය සිදු නොවන බවට වග බලා ගැනීමට පියවර ගෙන ඇත. වැරදි	මූල්‍ය චක්‍රලේඛයට අනුකූලව ක්‍රියා කළ යුතුය.
(ඓ)	උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි			
	(i) XVIII පරිච්ඡේදයේ 257 (I) , 257(II) රීති	2023, 2024 හා 2025 වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය ප්‍රකාරව ස්ථානමාරු නියෝග ලබාගත් නිලධාරීන් 23කට ස්ථානමාරු නියෝග ප්‍රකාරව මුදාහැරීමට කටයුතු නොකළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව විනය බලධාරි විසින් විනය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.	වැදගත් විභාග සහ කාර්යක්ෂමතා පරීක්ෂණ අඛණ්ඩව සිදුවෙමින් පවතින බැවින් සහ ඒවා ඉටු කිරීම සඳහා වගකිව යුතු වෙනත් දක්ෂ නිලධාරියෙකුට රහස්‍ය රාජකාරි වහාම භාර දීමට නොහැකි වූ බැවින් අදාළ නිලධාරියා නිදහස් කළ නොහැකි විය.	සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය
(ඒ)	2006 නොවැම්බර් 10 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 08 වගන්තිය	චක්‍රලේඛයට අනුකූලව තනතුරු උසස්වීම් සඳහා ශ්‍රේණිය සහ වැටුප් සංශෝධනය සිදු නොකර පර්යේෂණ නිලධාරීන් 04 ක් සඳහා චක්‍රලේඛයට පටහැනිව උසස්වීම් ලබා දී අතිරේක වැටුප් ගෙවීම් සිදු කර තිබුණි.	ප්‍රතිචාරයක් ලබා දී නොමැත.	චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඔ)	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අංක 2020/06 දරන චක්‍රලේඛය	බදුකුලී මුදල් ගෙවීම් දිරිගැන්වීම් සඳහා වාර්ෂික බදුමුදල් කාර්තුමය වශයෙන් අයකිරිම් සම්බන්ධයෙන් බදුකුලී හිමියන්ට නිවේදන නිකුත් කර අදාල ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට කන්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී වාර්තා පවත්වාගෙන යාමට පියවර ගනු ලැබේ.	වාර්තා පවත්වා ගැනීමට පියවර ගත යුතුය

(ඕ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	අතුරු අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් එක් වරකදී රු.100,000ක් දක්වා ලබාදිය හැකි වුවත්, මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් අතුරු අග්‍රිම ලබාදී තිබුණි.	අනාගතයේදී, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා පමණක් පියවර ගනු ලැබේ.	චක්‍රලේඛයට අනුකූල විය යුතුය
(ඒ)	2011 අංක 31 සහ 1994 අංක 6 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 33 දරන කෘමිනාශක බෙහෙත් පාලන පනතේ 21 (අ)	කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පත්කළ නිලධාරියා විසින් නිකුත් කළ සහතික දරන පුද්ගලයෙකුට හැර වෙනත් කිසිදු පුද්ගලයෙකුට පළිබෝධ නාශක විකිණීම් තහනම් කර ඇති නමුත් පළාතේ බලපත්‍රයක් නොමැති පුද්ගලයින්ට ඒවා විකිණීමට අවසර ලබාදී තිබුණි.	කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත්, නීතිමය පියවර ගනු ලැබේ.	නිවැරදි කිරීමට පියවර ගත යුතුය

1.5.2 ශීර්ෂය 400 – ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021, සිට 2024 අගෝස්තු දක්වා කාල පරිච්ඡේදයේ උතුරු පළාත් ආණ්ඩුකාරවරු ඔවුන්ගේ ඉන්ධන දීමනා මුදලින් ලබානොගෙන ඉන්ධන ඇණවුම් මගින් ලබාගැනීම හේතුවෙන් එලෙස ලබාගත් මූල්‍ය ප්‍රතිලාභවලින් රජයට ගෙවිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි.	2021-2024 කාලය තුළ, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි, ඔවුන්ගේ නම් කරන ලද වාහනයට ඉන්ධන සපයා නොමැති අතර ඉන්ධන ප්‍රභවයකින් පුරවා ඇත.	නීතිමය අවශ්‍යතාවලට අනුකූල විය යුතුය

1.5.3 ශීර්ෂය – 401 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා විභාග කාලසටහනට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සැලසුම් කළ විභාග 48කින් කාර්යක්ෂමතා පරීක්ෂණ 18 ක්, උසස්වීම් පරීක්ෂණ 02ක් සහ බඳවා ගැනීමේ පරීක්ෂණ 04ක් පවත්වා නොතිබුණි.	ශාලාවේ පහසුකම් නොමැතිකම හේතුවෙන් විභාගය ප්‍රමාද වූ අතර නුසුදුසුකම් සහ සේවා නීති සංශෝධනය කිරීම හේතුවෙන් උසස්වීම් විභාග නොපැවැත්වුණි. දැනට ඊට පිළියම් යොදමින් පවතී.	විභාග කාලසටහන අනුගමනය කරන බව සහතික කිරීමට පියවර ගත යුතුය.

(ආ)	2021 මැයි 05 දිනැති ප්‍රධාන ලේකම්වරයා ඇමතූ ජාතික වැටුප් කොමිසමේ නිර්දේශ ලිපියේ සඳහන් පර්යේෂණ නිලධාරීට වර්ෂ 10ක සේවා කාලයකින් පසු පර්යේෂණ නිලධාරී I ශ්‍රේණියට උසස් කිරීම් සිදුකිරිම සමස්ත රජයේ සහ පළාත් සේවාවන්ටම අහිතකර ලෙස බලපාන බව සඳහන් කර තිබුණද, එය නොසලකා අදාල පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් I ශ්‍රේණියට රු.748,562 ක වැටුප් වැඩිවීමක් සහිතව වැරදි සහගත තනතුරු උසස්වීමක් ලබා දී තිබුණි.	උසස්වීම් ක්‍රියාවලියේදී උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාට ඇමුණුම I සහ ඇමුණුම II හරහා දැනටමත් ලබා දී ඇති උපදෙස් සහවා ජාතික වැටුප් කොමිසම විසින් ජාතික වැටුප් කොමිසම නොමඟ යවා ඇත. 2021.05.05 දිනැති NSCC/12/74/6/SA ලිපිය වැටුප් කොමිසමෙන් ලැබී ඇත.	නිවැරදි කිරීමට පියවර ගත යුතුය.

1.5.4 ශිර්ෂය – 411 - පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 13,538,245කට ගිවිසුම්ගතවූ ව්‍යාපෘතිය, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එකතුව රු. 5,411,837ක් වැයකර තිබූ නමුත් එදින වන විටත් අදාල ව්‍යාපෘතිය පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සම්පූර්ණ කර නොතිබුණි.	මෙම වසරේ ජුනි මාසය වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට පියවර ගනිමින් පවතී.	නියමිත කාලය තුළ වැඩ නිම කිරීම සහතික කිරීමට පියවර ගත යුතුය
(ආ)	සමාලෝචිත වර්ෂයේ එකතුව රු.48,370,000ක වටිනාකම ගොවි කළමනාකරු නිකේතනය අළුත්වැඩියා කිරීම යනුවෙන් දක්වා කාර්යාල ගොඩනැගිල්ලක්, පළාත් කෘෂි අමාත්‍යාංශය විසින් ඉදිකරමින් පැවැතුණි.	එය සාම්ප්‍රදායික ගොඩනැගිල්ලක් බැවින්, එය නවීන පහසුකම්වලින් සන්නද්ධ කිරීම සඳහා ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී.	නිසි අනුමැතිය ඇතිව පමණක් ඉදිකිරීම් සිදු කළ යුතුය.

1.5.5 ශීර්ෂය 412 - පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විදුලි ජනක යන්ත්‍රයක් 2018 ඔක්තෝබර් 30 දින මිලදීගෙන තිබූ අතර මේ සඳහා සම්පූර්ණ වර්ෂ 03ක වගකීමෙන් පසු සේවාවන් ලබාදී තිබුණි. එනමුත් මෙම යන්ත්‍රය නුසුදුසු ස්ථානය සහ ප්‍රමාණවත් වාතාශ්‍රයක් නොමැතිකම හේතුවෙන් යන්ත්‍රය 2023 ජනවාරි මාසයේදී අක්‍රිය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ නව යන්ත්‍රයක් රු.2,551,012කට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මිලදී ගෙන තිබුණි.	නව යන්ත්‍රය පැරණි වේදිකාවේ ස්ථාපනය කර ඇතත් විමර්ශන කණ්ඩායමේ වාර්තාවට අනුව, ATS පැනල් සාධකවලින් එය භෞතිකව ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත.	වත්කම්වල ආරක්ෂාව සහතික කළ යුතුය.

1.5.6 ශීර්ෂය – 413 - පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 53 ක් පුරවා තිබුණද, දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ, ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල පවතින පුරප්පාඩු 224ක් හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්ත්මේන්තුවේ පැවැති දෙපාර්තමේන්තුමය කාර්ය මණ්ඩල පුරප්පාඩු 113ක් පිරවීම් සම්බන්ධයෙන්ද අමාත්‍යාංශය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සීමිත බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට අවසර ලබාගෙන ඇති බැවින්, දැනටමත් විවිධ තනතුරුවල සේවය කරන අයගෙන් සීමිත බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.	පිරිස් පුරප්පාඩු පිරවීම සඳහා ඵලදායී පියවර ගත යුතුය.

1.5.7 ශීර්ෂය – 425 - පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ආදායම් සංකේතාංක 04ක් සඳහා ආදායම් ඇස්තමේන්තු එකතුව රු. 3,350,000ක් පසුගිය වර්ෂයේ ඇස්තමේන්තුව සමග සැසඳීමේදී නොවෙනස්ව පැවතුණු නමුත් එම ආදායම් සංකේතාංකවලින් සියයට 17 සිට 65ක් දක්වා විචලනයන් පැවතීමෙන් ආදායම් ඇස්තමේන්තු, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ආදායම් මූලාශ්‍රයන් පදනම් කරමින් වඩා තාත්වික අයුරින් ආදායම් ඇස්තමේන්තු සිදු කර නොතිබූ බව හෙළිදරව් විය.	මේවා ප්‍රාදේශීය මට්ටමින් ලේකම් කාර්යාල මගින් එකතු කර අප වෙත එවනු ලැබේ. බනිජවල විකුණුම් පරිමාව මත පදනම්ව බද්ද එකතු කරනු ලැබේ.	වඩාත් තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් කළ යුතුය.

1.5.8 ශීර්ෂය – 430 - පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, වවුනියාවට අයත් රු.6,869,000ක් වටිනාකමක් සහිත විවේකාගාර 03ක් අභාවිතව පැවති අතර රු.4,200,000ක වටිනාකමක් සහිත විධායක ඉංජිනේරු විවේකාගාරයක්ද අළුත්වැඩියා කිරීමකින් තොරව පැවතුණි.	නිලධාරියා ඉක්මනින් බඳවා ගැනීමට කටයුතු කරන බව කරුණාවෙන් දන්වා සිටිමි.	නේවාසිකාගාර භාවිතා කිරීමට පියවර ගත යුතු අතර විධායක ඉංජිනේරු විවේකාගාරය අලුත් වැඩියා කර භාවිතයට ගත යුතුය.

1.5.9 ශීර්ෂය 431 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති 02ක් රු.මිලියන 20.5කට ඇස්තමේන්තු කර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 1.3ක වියදම් පමණක් සිදුකර තිබියදී ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.	පොකුණේ ජල මට්ටම අඩු නොවීම සහ මෝසම් වැසි ඇද හැලීම හේතුවෙන් වැඩ අත්හිටුවා කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. තවද, මෙම වසරේ ප්‍රතිපාදන තුළ වැඩ නිසි ලෙස සිදු කරනු ලැබේ.	ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය

(ආ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මන්නාරම කුරායිකුලම ව්‍යාපෘතියේ එකතුව රු. 10,832,130ක් වටිනා වැව් බැම්ම ප්‍රතිසංස්කරණ කාර්යයේදී තණකොළ ක්‍රමානුකූලව සිටුවා නොතිබීම මත වැව් බැම්මද වර්ෂාව හා ගංවතුරෙන් සේදී ගොස් හානිවී තිබුණි.	වේල්ල හරහා බර වාහන ගමන් කිරීම තහනම් කර තිබියදීත්, වේල්ල හරහා බර වාහන ගමන් කිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය. රඳවා තබා ගැනීම ද යම් කාලයක් තුළ මේවා නිවැරදි කරනු ලැබේ.	සුදුසු ප්‍රමිතියට අනුව ඉදිකර ඇති බවට සහතික විය යුතුය.
(ඇ)	වන්නේරිකුලම මාර්ගයෙන් වාරිජල පහසුකම් සලසා අක්කර 240ක් යල කන්නයේ වී වගාව සිදුකර තිබියදී, අක්කර 800කට යල කන්නයේ වගාවන් සිදු කිරීමේ අරමුණ ඇතිව වාරි ප්‍රතිසංස්කරණ සඳහා රු. මිලියන 93.66ක් වැයකර තිබුණි. එසේ වුවත් නියමිත කාලය තුළ කාර්යයන් අවසන් කර නොතිබූ බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ නිමවුම් මට්ටම ලබාගැනීමට නොහැකිව තිබුණි.	දේවන්කට්ටු පොකුණ පනිකන්දමඩු රක්ෂිත වනාන්තරය තුළ පිහිටා ඇති අතර එබැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බාධාවක් ලෙස සැලකේ. ව්‍යාපෘතිය අනුමත වුවහොත්, සියලු කටයුතු සැලසුම් කළ පරිදි අවසන් කළ හැකි බව මම ඔබට දන්වමි.	නියමිත කාලය තුළ වැඩ නිම කර ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	කල්මඩුකුලමේ වේල්ල සඳහා වූ Spill Structure ව්‍යාපෘතිය ඇස්තමේන්තුවට ඇතුළත් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන්, රු. මිලියන 522.82 ක් වැයකර තිබූ නමුත් වැඩිපුර වැසි ජලය රඳවා ගැනීමට නොහැකි වී තිබුණි.	පොකුණේ ජල පරිභෝජනය වැඩි කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ඉල්ලා අයදුම්පතක් ඉදිරිපත් කර ඇත.	වැඩසටහන ඵලදායී බව සහතික කිරීම සඳහා පියවර ගත යුතුය.
(ඉ)	කොන්ත්‍රාත් කාර්යයන් 15ක් සඳහා එකතු කළ අගය මත බදු (VAT) එකතුව රු.2,507,342ක ගෙවීම් මාස 05 සිට වර්ෂ 02ක් දක්වා කාලයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නොගෙවා තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	එය රජයේ ආදායම බවට පත් කිරීමට පියවර ගෙන තිබේ.	සාධනීය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.10 ශීර්ෂය 432 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලෝක බැංකු මුල්‍ය වැඩසටහන යටතේ කොවිඩ් - 19 හදිසි ප්‍රතිකාර වැඩසටහන ක්‍රියාත්මක කළ ගබඩා පහසුකම් සැලසීමේ 2021 ව්‍යාපාතියේ මුලංගාවිල් හා පුන්නෙයිනීරාවි ප්‍රදේශවල ධාන්‍ය ගබඩා ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ කාර්යාල වෙත භාර දී තිබූ නමුත් මාස 16 කට පසුව ඒවා භාවිතා කළ යුතු බීජ නිෂ්පදන සමිති වෙත භාර දී තිබූ අතර භාර දී වර්ෂ 2 ක් ඉකුත් වී තිබූ නමුත් ඉදිකිරීම් අරමුණු වෙනුවෙන් මේ දක්වා භාවිතා නොකර පැවතුණි.	දැනට ගොඩනැගිල්ලේ අමතර වැඩ කිහිපයක් සිදු කෙරෙමින් පවතී. මෙය අවසන් වූ පසු, එහි අපේක්ෂිත අරමුණ සඳහා එය භාවිතා කිරීමට පියවර ගනු ලැබේ.	නිශ්චිත අරමුණ සඳහා එය භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ආ)	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, කිලිනොච්චියේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු.2,266,000ක් වටිනා එයාර් කොම්ප්‍රෙෂර් සහ රු.216,332ක් වටිනා ප්ලේට් කොම්පැක්ටර් අළුත්වැඩියා කළයුතු තත්ත්වයක පැවතියද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙම යන්ත්‍රය නැවත උපකරණ සඳහා ලංසු තැබීමේ ක්‍රියාවලිවය අපි මෙම වසරේ භාරගෙන ඇත්තෙමු.	අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එකතුව රු.397,450,361ක මූලධන කාර්යයන් 2024 වර්ෂය සඳහා වූ වැඩ කොන්ත්‍රාත් සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවේ ලියාපදිංචි නොකළ හා පූර්ව සේවා පළපුරුද්ද ආදි කරුණු සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන තිබීම මත මාර්ග සංවර්ධන කටයුතුවල අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය.	2.14.1 ගයිඩ්ලයින් 3.4 උපඡේදය ප්‍රකාරව ප්‍රධානය කරන ලද්දේ ප්‍රකාශිත අතීත කාර්ය සාධනය මත ය. කෙසේ වෙතත්, ලියාපදිංචි කොන්තත්‍රකරුවන් සලකා බලනු ලබන අතර අනාගතයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.	සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුය.

(ඇ)	සමාලෝචිත වර්ෂයේ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකතුව රු. මිලියන 24.91 ක මූලධන කාර්යයන් 02ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රකාරව ලංසු නොකැඳවා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව වෙළෙඳපොල සැදැහුම් ක්‍රමය යටතේ ලංසු ලබාගෙන කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන මාර්ග ඉදි කර තිබීමෙන් මාර්ග සංවර්ධන කටයුතුවල අඩුපාඩු පැවති බව නිරීක්ෂණය වී තිබුණි.	අපගේ දෙපාර්තමේන්තුවේ කෙටි කාලයක් තුළ කාර්යක්ෂමව වැඩ නිම කර ඇති තෝරාගත් කොන්ත්‍රාත්කරුට, නියමිත වේලාවට වැඩ නිම කරන ලෙස ඉල්ලා ඇති අතර, නිසි පරිදි වැඩ නිම කර ඇත.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය.
(ඉ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශයේ සඳහන් කර ඇති පරිදි කොන්ත්‍රාත් කාර්යයන් ඉටුකිරිමේ ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් තොරව හෝ ඒවා සැලකිල්ලට නොගෙන ලේඛනගත සාක්ෂි නොමැතිව හා එකම දිනයේදී එකතුව මිලියන 80 ක් වූ මාර්ග නඩත්තු කාර්යයන් 05 සඳහා දෙපාර්තමේන්තුවේ අභිමතය පරිදි කාර්යයන් 05ක් සඳහා කොන්ත්‍රාත්කරුවන් 05කගෙන් පමණක් වෙළෙඳපොල සැදැහුම් ක්‍රමයට ලංසු ගෙන්වා ගෙන කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.	වවුනියාව දිස්ත්‍රික්කයේ යටතේ වැඩිම වැඩ කොටසක් භාරගෙන, වෙළඳපොළ සැඳහුම් ක්‍රමය හරහා සුදුසු තත්ව අනුමැතියන් සහිතව හොඳ කාර්ය සාධනයක් පෙන්නුම් කළ කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකුගෙන් ලංසු කැඳවන ලදී. කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු සලකා බලා අඩුම ලංසුකරු තෝරා ගන්නා ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය.
(ඊ)	මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කරුක්කායිතිවු, කාවෙයිකුලම් මාර්ගය නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අදාල ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබූ ලංසුකරුගේ ලංසු මුදල් එකතුව රු.1,617,081ක් දෙවරක් වංචනික අරමුණින් කපා සංශෝධනය කර තිබුණු අතර එකී ලංසු ද පිළිගෙන තිබුණි.	කිසිදු පිළිතුරක් ලබා දී නොමැත.	මිල වෙනස්වීම සම්බන්ධයෙන් සුදුසු විමර්ශන සහ ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	එකතුව රු.21,498,610ක් වටිනා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරී නේවාසිකාගාර 09ක් නිෂ්කාර්යව පැවැති අතර නියෝජ්‍ය ඉංජිනේරු කාර්යාලය, වවුනියාවේ පිහිටි රු.1,294,609ක් වටිනා අංක 9B දරන නිලධාරී නේවාසිකාරයද අළුත්වැඩියා නොකර නිෂ්කාර්ය තත්ත්වයෙන් වර්ෂ 05කට අධික කාලයක් පැවැතුණි.	නිවාස අංක 11 භාවිතා කිරීමට සුදුසු තත්ත්වයේ නොමැති බැවින් ලබාදීමට නොහැකි විය.	වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.

1.5.11 ශීර්ෂය – 441 - පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා

සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2019 වර්ෂයේදී පළාත් නිෂ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) අරමුදලින් රු.17,138,008ක් වැයකර ඉදිකළ මන්නාරම සුරක්ෂා/ආරක්ෂක නිවාසය පසුගිය වර්ෂ 03ක කාලයක සිට අභාවිතව පැවැති අතර එම ගොඩනැගිල්ලට අදාල ආරක්ෂක නිලධාරීන්ගේ වැටුප් ලෙස එකතුව රු.1,641,460ක් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි.	පිළිතුර ලබා දී නැත	ගොඩනැගිලි භාවිතා කිරීමට සුදුසු පියවර ගත යුතුය
(ආ)	පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අච්චුවේලි සහතිකලත් පාසැලෙහි නැතිවී ගිය රු.220,500ක් හා රු.106,360ක් වටිනා පරිගනක කට්ටල පාඩු හා රු.523,139ක හානිවීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ලැබුණු පසු දේපළ අහිමි වීම සම්බන්ධයෙන් පියවර ගනු ලැබේ.	පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.12 ශීර්ෂය 450 - පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උතුරු පළාතේ රෝහල්වල බාහිර රෝගී අංශයේ HHIMS පද්ධතිය ක්‍රියාත්මක කිරිමට ලබාදුන් උපකරණ භාවිතා කර රෝහල් 06ක එම පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් පැවැති නමුත් උතුරු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක සහ මූලික රෝහල්වල අදාල අරමුණු වෙනුවෙන් ලබාදුන් උපකරණ භාවිතයට ගෙන නොතිබූ අතර සියළුම සෞඛ්‍ය ආයතනවල පරිගණකගත සෞඛ්‍ය තොරතුරු	නිශ්චිත භාවිතය සඳහා මෘදුකාංග සේවකයින්ගේ දැඩි හිඟය හේතුවෙන්, පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.	පරිගණකගත සෞඛ්‍ය තොරතුරු පද්ධතිය පුළුල් කිරීමට හා යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.

	පද්ධතිය පුළුල් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි.		
(ආ)	සමාලෝචිත වර්ෂයේ කිලිනොච්චිය රෝහලේ පටක විද්‍යා විශේෂඥ වෛද්‍ය (Histopathologist Consultant) ලෙස සේවය කළ වෛද්‍යවරයා විදේශීය අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා විදේශගත වීම හේතුවෙන් එම රෝහලේ පටක විද්‍යා විශ්ලේෂණ, අදාල කාල පරාසය තුළ Histopathology සාම්පල 366 ක් සහ cytology සාම්පල 54ක් පරීක්ෂාවට ලක් කිරීමට නොහැකි වී ඇති අතර රෝගීන්ට නියමිත ප්‍රතිකාර ලබා දී නොතිබුණි.	වෛද්‍ය විශේෂඥයා විදේශගත වීම හේතුවෙන් විශ්ලේෂණය නොකළ සාම්පල දැනට මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලට පරීක්ෂණ සඳහා යවන බව මම ඔබට දන්වමි.	රෝගීන්ට අඛණ්ඩව ප්‍රතිකාර ලබාදීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	පළාත් රියැදුරු සේවා නිලධාරීන් සෞඛ්‍ය ක්ෂේත්‍රය සමග දීර්ඝ කාලයක් සේවය කර පසුගිය වර්ෂ 03 තුළ ස්ථාන මාරුවීම් නියෝග ලබා ස්ථාන මාරුකර ඇති නමුත් කිහිප වතාවක් අනතුරු සිදු කළ රියදුරන් වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගය මත පදනම්ව නිදහස් කිරීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තු පරිපාලනය කටයුතු කර නොතිබුණි.	ඉක්මනින් ඔහුව නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.	වාර්ෂික මාරු කිරීමේ නියෝගය අවශ්‍ය පරිදි ක්‍රියාත්මක කළ යුතුය.
(ඈ)	ක්ෂුද්‍රජීව විද්‍යා (Microbiologist) විශේෂඥ වෛද්‍යවරයා වර්ෂයකට අධික කාලයක් කිලිනොච්චිය රෝහලේ සේවය කරන අතර එම වෛද්‍ය විශේෂඥයින්ට අදාල කාල පරිච්ඡේදය තුළ රු.1,348,938 ක් ගෙවා ඇති නමුත් එම පරීක්ෂණවලට ලබාගන්නා සාම්පල යාපනය ශික්ෂණ රෝහලට යවා තිබුණි.	ක්ෂුද්‍රජීව විද්‍යා (Microbiologist) විශේෂඥ වෛද්‍යවරයා මොනරාගල රෝහලට මාරු කර යවා ඇති අතර සාම්පල දැනට යාපනයේ තබා ඇත.	ක්ෂුද්‍රජීව විද්‍යාගාරය ක්‍රියාකාරීව තබා ගැනීමට පියවර ගත යුතුය.

(ඉ)	වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සහ මූලික රෝහල්, කිලිනොච්චිය දිස්ත්‍රික් රෝහල සහ අච්චුවේලි ප්‍රාදේශීය රෝහල්වල බාහිර රෝගී අංශවල, වෛද්‍යවරුන් විසින් දෛනිකව එක් කොට්ඨාශයක බෙහෙත් වට්ටෝරු අත්සන් නොකර බෙහෙත් නිකුත් කර තිබුණි.	වෛද්‍ය ප්‍රතිකාර සහ උපදේශන සඳහා පැමිණෙන රෝගීන් සංඛ්‍යාව විශාල වීම සහ වෛද්‍ය නිලධාරීන් වැරදීමකින් බාහිර රෝගී බෙහෙත් වට්ටෝරුවට අත්සන් නොකිරීම හේතුවෙන්, අනාගතයේදී අත්සන් නොවරදවාම තැබිය යුතු බවට උපදෙස් දී ඇත	වෛද්‍යවරුන් බෙහෙත් වට්ටෝරු අත්සන් කිරීමට පියවර ගත යුතුය.
(ඊ)	2022 ජනවාරි 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔමන්ත රෝහල (Type – C) C වර්ගයේ රෝහලක් ලෙස උසස් කර තිබූ නමුත් වාර්තා කරන දින වන විටත් එම තත්ත්වයේ වූ රෝහලක් ලෙස මෙහෙයුම් කටයුතු සිදුකිරිමට පියවර ගෙන නොතිබුණි.	අදාළ රෝහල ප්‍රාදේශීය රෝහලක් ලෙස ක්‍රියාත්මක කළ හැක්කේ අවශ්‍ය කාර්ය මණ්ඩලය, උපකරණ සහ සියලු පහසුකම් තිබේ නම් පමණි. මේ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	ප්‍රාදේශීය රෝහලක් ලෙස ක්‍රියාත්මක වීමට පියවර ගත යුතුයි.
(උ)	අහඹු ලෙස සිදු කරන ලද රෝහල පරීක්ෂාවේදී රාජකාරි ලැයිස්තු ප්‍රකාරව උදේ 8.00 සිට දහවල් 12.00 දක්වා වෛද්‍යවරුන් තිදෙනෙකු රාජකාරියේ නියැලිය යුතු වුවත්, නෙඩුංකේනි ප්‍රදේශ රෝහලේ වෛද්‍යවරයෙකු පමණක් රාජකාරියේ යෙදී සිටි අතර නච්චි-මූලික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයේ සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී, වෛද්‍යවරයා සහ ඖෂධ සංයෝගකරු යන දෙදෙනාම රාජකාරියේ යෙදී නොසිටියහ. එසේම, පූවරසම්කුලම ප්‍රදේශ රෝහල භාර නිලධාරියා ද අදාළ දිනයේ රාජකාරියේ යෙදී නොතිබුණි.	ක්ෂේත්‍ර සංචාරය අතරතුර, භාර වෛද්‍ය නිලධාරියා රාජකාරියෙන් බැහැරව සිටියේ දිවා ආහාරය සඳහා සහ ඖෂධ සංකීර්ණ කාර්යාල කටයුතු සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා වැඩමුළුවට ගොස් සිටි බැවිනි.	කාර්ය ලැයිස්තුවට අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

(ඌ)	වෙට්ටිකුලම්, මල්ලාවි, මූලික රෝහල් සහ අක්කරායන් ප්‍රාදේශීය රෝහලේත් ඖෂධ සංයෝගකරුවන් සහ ඖෂධවේදීන් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී රාජකාරියේ නියැලී නොසිටීම පිළිබඳව විගණනයේදී වාර්තා කර තිබූ නමුත් කළමනාරකණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සේවකයින්ගේ රාජකාරි වේලාවන් නිරීක්ෂණය කිරීමට ද උපදෙස් නිකුත් කර ඇති අතර, අදාළ සංයෝගකරු දැන් වන්නේරිකුලම් රෝහලට මාරු කර ඇත.	රාජකාරියට නොපැමිණීම සම්බන්ධයෙන් සත්කාරක සමාගම විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(එ)	ක්‍රිශ්ණපුරම් වසංගත රෝග රෝහල්වල කොරෝනා කාලපරිච්ඡේදයේ සැපැයුම්කරුවකු ලෙස තෝරාගත් නමුත් සේවාවන් නොසපයා රු.1,973,028ක් වැඩිපුර ගෙවීම් ලබාගෙන තිබූ රෝහල් ආහාර සැපයුම්කරුට එරෙහිව ක්‍රියාමාර්ග නොගෙන වර්තමානයේදී ද කිලිනොච්චිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල පරිපාලනයට යටත් වූ රෝහල්වලට පිසූ ආහාර සහ දිස්ත්‍රික්කයේ වියලි ආහාර සැපයුම්කරු ලෙස ලංසු පිරිනමා තිබුණි.	2025/2026 වර්ෂය සඳහා ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය හරහා ලංසුවක් කැඳවන ලද අතර අපගේ ප්‍රසම්පාදන ලේඛනයේ ඉල්ලා ඇති කොන්දේසි මත පදනම්ව සුදුසුකම් ලත් සැපයුම්කරුවෙකු තෝරාගෙන ඇත.	විමර්ශනයක් කර අදාළ පියවරයන් ගත යුතුය.
(ඒ)	කිලිනොච්චිය රෝහලේ ස්කෑනිං අංශයේ ඇති යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා නොකිරීමෙන් රෝගී ප්‍රතිකාරක සේවා සැපයීමට බාධා වී තිබුණි.	වසරකට දෙවරක් යන්ත්‍රය සේවා කර නොමැති බැවින්, යන්ත්‍රය පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා අදාළ සමාගමට ලිපියක් යවා ඇත.	අළුත්වැඩියා කර භාවිතා කිරීමට පියවර ගත යුතුය.

1.5.13 ශීර්ෂය 451 - පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අච්චුවේලි දේශීය ඖෂධ නිෂ්පාදන ඒකකය, මඟින් නිෂ්පාදනය කරනු ලබන ඖෂධ වර්ග 79ක නිෂ්පාදනය සිදුකිරිමටත් එහි කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා හෝ නිෂ්පාදන ධාරිතාව වැඩිකිරිමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි.	අච්චුවේලි ඖෂධ නිෂ්පාදන ඒකකය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීම සඳහා 2025 PSDG හි රුපියල් මිලියන 30 ක අරමුදලක් වෙන් කර ඇත.	ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලදී ගැනීමෙන් නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගත යුතුය.

1.5.14 ශීර්ෂය 460 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මු/විසුවමඩු මහා විද්‍යාලයේ සේවය කළ ඉංග්‍රීසි විෂය ගුරුවරයාට එරෙහිව ආණ්ඩුකාරවරයා විසින් විනය පරීක්ෂණ සිදුකිරීමට උපදෙස් ලබාදී තිබූ අවස්ථාවේදි පළාත් අධ්‍යක්ෂවරයා මුලතීව් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මාර්ගයෙන් ස්ථානමාරු ලබාදුන් විට එම ස්ථානමාරුව පිළිනොගෙන කිහිප වතාවකදී තාවකාලික අනුයුක්ත කිරීම් මත යාපනයේ සේවය කර අනුයුක්ත කළ කාලය අවසන් වීමෙන් පසුත් ඔහුගේ සේවා ස්ථානයට වාර්තා නොකිරීම මත සේවය අත්හිටුවා තිබුණ ද එකී කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.247,340ක් වැරදි ලෙස වැටුප් ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 8.2 ට අනුකූලව උපචිත නිවාඩු (නිවාඩු ලබා ගත් වර්ෂයේ සහ පෙර වර්ෂයේ සිට ඉතිරිව ඇති විවේක නිවාඩු) සකස් කර ඇති අතර ඉහත නිවාඩු සකස් කර ඇත. ගුරුවරයාට හිඟ වැටුප් ලෙස රු. 247,340.00 ක් ගෙවන ලදී.	ආයතන සංග්‍රහයට අනුව අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	යා/හාට්ලි විද්‍යාලයේ මධ්‍ය/ද්විතියන පන්තිවලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී පාසල ආසන්නයේ සිටින සිසුන්ට ප්‍රමුඛතාවය ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 17/2023 දරන චක්‍රලේඛයේ විධිවිධාන විදුහල්පතිවරයා විසින් අනුගමනය කර නොතිබුණි.	අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 17/2023 අනුව පාසල් බලපත්‍ර ලබා ගන්නා ලෙස පාසල් විදුහල්පතිවරුන්ට උපදෙස් දී ඇත.	චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	යා/කොකාවිල් හින්දු ප්‍රාථමික විදුහලේ ශිෂ්‍යයින් සඳහා රජයේ පෝෂණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුට 2023 වර්ෂ කාලපරිච්ඡේදයේදී වැඩියෙන් ගෙවන ලද රු.2,344,000ක් නැවත අයකර නොතිබූ අතර එම කාලපරිච්ඡේදයෙන් පසුව වූ වැඩිපුර ගෙවීම්ද හඳුනාගෙන තිබූ අතර ඒවාද ආපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	අලාභයේ වටිනාකම රුපියල් 500,000 ඉක්මවන බව සොයා ගත් බැවින්, අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් අලාභ තක්සේරු කමිටුවක් පත් කර ඇත.	අතිරික්ත ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය.

(ඇ)	පළාත් පාසැල් නියැදි විගණනයට ලක්කළ අවස්ථාවේදී අධ්‍යාපන කලාප 06කට අයත් පාසැල්වල යුද්ධය, සොරකම් වැනි හේතූන් නිසා සිදුවූ එකතුව රු.5,528,950ක පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ගැලපීම් සිදුකිරිමට වර්ෂ 01 සිට 28ක් දක්වා කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	සොරකම් සහ වෙනත් හේතූන් මත සිදු වූ පාඩු විමර්ශනය කිරීම සඳහා විමර්ශන කමිටුවක් පිහිටුවා ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය
(ඉ)	තුනුක්කායි අධ්‍යාපන කලාපයේ සේවය කළ ගුරුවරයෙකුට පළාත් වෘත්තීය පුහුණු සම්බන්ධීකාරක තනතුර 2019 අවසන් කර තිබූ අතර මෙම තනතුරට අදාල රාජකාරි ඉටුකිරිම සඳහා ලබාදුන් යතුරු පැදිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කලාප කාර්යාල අධ්‍යක්ෂවරයාට ආපසු භාරදී නොතිබුණි.	මෙම පුහුණු මධ්‍යස්ථානයේ සේවය කළ ගුරුවරයා මාරු කර ඇතත්, ඔහු තවමත් තම වගකීම් භාර දී නොමැත. නැවත නැවතත් ඉල්ලීම් කළත් ඔහු ඉදිරිපත් වූයේ නැත.	යතුරු පැදිය ආපසු ලබා ගැනීමට පියවර ගත යුතුය.
(ඊ)	උතුරු පළාත් රාජ්‍ය සේවා ආයතන ක්‍රියා පටිපාටි සංග්‍රහයේ VIII රීතියේ 203 වගන්තිය ප්‍රකාරව, අධ්‍යයන හා අනධ්‍යයන සේවකයින් 22 දෙනෙකු වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා තිබූ නමුත්, වර්ෂයකට අධික කාලයක සිට ස්ථානමාරුවීම ලැබූ රාජකාරි ස්ථානයේ, රාජකාරි භාරගෙන නොතිබුණි.	තෙන්මාරච්චි තනතුර තහවුරු කිරීම සඳහා ලියකියවිලි යවා ඇත. අනෙකුත් නිලධාරීන් සඳහා පියවර ගනිමින් පවතී. වලිකාමම් උසස් පාසල් සහතිකයේ නම් වෙනස් කිරීම, උපාධි සහතිකය තහවුරු කිරීම ලබා ගත නොහැක. මුලතිව් ලේඛන සම්පූර්ණ කර ඉදිරිපත් කළ පසු තනතුර තහවුරු කිරීමට පියවර ගනු ලැබේ.	මාරු කරන නමුත් රාජකාරී ස්ථානයේ රාජකාරි භාර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගත යුතුය.

(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 සහ 8.9.3ට අනුව ද්විතියික මට්ටමේ පාසැල් සඳහා රු.1,136,000ක Mathematics tool kits මිලදී ගැනීමේදි සහ රු.3,910,000කට External hard disk 230ක් මිලදී ගැනීමේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම්වලට එළැඹීමට කටයුතු කර නොතිබුණි.	සැපයුම්කරුවන් භාණ්ඩ ලබා දීමට සූදානම් බව සහ සැපයුම්කරුවන් බැඳුම්කරයක් ලබා දී ඇති බව සැලකිල්ලට ගෙන, අප විසින් භාණ්ඩ වහාම මිලදී ගෙන පරීක්ෂා කරන ලද අතර ඉහත කොන්ත්‍රාත්තුවට එළඹුණේ නැත.	අත්පත් කර ගැනීමේ මාර්ගෝපදේශයට අනුව ක්‍රියා කළ යුතුය.
(ඌ)	තුනුක්කායි අධ්‍යාපන කළාපය මගින් පාලනය කෙරෙන පළාත් තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය 2023 ඔක්තෝබර් 06 දින සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වසා තිබීමෙන් ශිෂ්‍ය තාක්ෂණික හැකියා වර්ධනය සඳහා රජයේ අරමුදලින් මිලදීගත් උපකරණ 323ක් නිෂ්කාර්යව පැවැතුණි.	මෙම පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව සඳහා අයදුම් කරන සිසුන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් මෙම පුහුණු මධ්‍යස්ථානය තවමත් වසා දමා ඇත.	වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.

1.5.15 ශීර්ෂය – 461 - පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 දෙසැම්බර් 04 දින සංගානෙයි බැට්මින්ටන් ගෘහස්ථ අවශ්‍යතා සඳහා මිලදී ගත් රු.684,000ක බැට්මින්ටන් carpet පසුගිය වර්ෂ කාලය තුළ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.	අනපේක්ෂිත හා අත්‍යවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සිදු වූ නිසා, එම කටයුතු පසුව භාවිතා කිරීම සඳහා කල් දමා තිබුණි. දැනට එය භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී.	නිශ්චිත අවශ්‍යතාවය සඳහා එය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	රු. 2,301,000කට මිලදී ගත් Boxing ring සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව පූර්ණ වශයෙන් භාවිතා කර නොතිබුණි.	සවිකිරීම අවසන් වූ පසු, ශ්‍රී ලංකා බොක්සිං සංගමයෙන් උපදෙස් ලබා ගැනීමට පියවර ගෙන ඇත. උපදෙස් ලැබුණු පසු, හැකි ඉක්මනින් එය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.	සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය

(ඇ)	කිලි/ධර්මපුරම් මධ්‍ය මහා විද්‍යාලයේ පැසිපන්දු පිටිය, 2017/2018 සහ 2021/2022 ආදි කාල පරිච්ඡේදවල පළාත් නිෂ්චිත සංවර්ධන අරමුදලින් රු. මිලියන 3.3කින් ඉදිකර තිබුණි. මෙම පිටිය නිසි ලෙස උපයෝජනය හා නඩත්තු කිරිම් නොමැතිව පැවැති අතර ආරක්ෂක වැටවල් ද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් ඉදිකර නොතිබුණි.	දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, පුහුණුකරුවන් දෙනෙකු සහ ක්‍රීඩා නිලධාරීන්ට පුහුණුවට අදාළ වාර්තා ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.	නිසි භාවිතය සහ නඩත්තුව ද සිදු කළ යුතුය.

1.5.16 ශිර්ෂය 470 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	යාපනය මහනගර සභාව විසින් පසුගිය වර්ෂවලට අදාල හිඟහිටි වරිපනම් බදු හා අනෙකුත් ආදායම් එකතුව රු. 210,946,322ක් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.	පසුගිය වසරවලදී ජංගම සේවා පවත්වා ගාස්තු එකතු කරන ලදී.	හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ඵලදායී පියවර ගත යුතුය.
(ආ)	යාපනය මහනගර සභාව විසින් පසුගිය වර්ෂවල ලබාදුන් අත්තිකාරම් එකතුව රු. 6,668,065ක් පසුගිය වර්ෂ 05ක සිට නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.	1995 ට පෙර සිට පැවති හඳුනා නොගත් සහ ලේඛනගත කර නොමැති, අයකර ගත නොහැකි රු. 5,294,066 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් පියවර ගනිමින් පවතී.	අත්තිකාරම් ගෙවීම් පැහැර ඇති ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.

1.5.17 ශිර්ෂය – 471 - පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ ජනතාව සහ ගම් මට්ටමේ සංවිධාන අතර සමීප සම්බන්ධතාවක් ඇති කර ගැනීම වුවද, සමිති 2525 හි ක්‍රියාකාරකම් වඩාත් ඵලදායී කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2024 මාර්තු සහ 2025 මාර්තු වන විට ග්‍රාම සංවර්ධන සමිති පිළිවෙලින් 260 ක් සහ 92 ක් සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති පිළිවෙලින් 374 ක් සහ 113 ක් සක්‍රීය කර ඇති අතර 2024 ට සාපේක්ෂව 2025 පළමු කාර්තුවේදී වැඩිම සමිති සංඛ්‍යාවක් අලුත් කර ඇති බව ද පැහැදිලි වේ.	ගම් මට්ටමේ ආයතන වැඩිදියුණු කිරීමට පියවර ගත යුතුයි.

1.5.18 ශීර්ෂය 480 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුමේ පැවැති ILO ව්‍යාපෘති අරමුදල් රු.1,206,665ක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර රජයේ ආදායමට මාරුකර තිබුණි.	අනුමත කරන ලද ව්‍යාපෘතිවලින් බහුතරයක් අවසන් කර ඇති අතර ඉතිරි මුදල වෙනත් ව්‍යාපෘති යෝජනා සඳහා භාවිතා කළ නොහැකි බැවින් ආදායම් ගිණුමට මාරු කර ඇත.	අරමුදල් අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ආ)	පසුගිය වර්ෂ 01 සිට 10ක් දක්වා කාල පරාසය තුළ උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැවැති වාහන 22ක් අක්‍රියව අළුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි.	මෙම වසරේදී මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.	අළුත්වැඩියාවන් සිදු කර ඒවා භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ධාවනයේ පවතින වාහන 11ක් ප්‍රධාන ලේකම්ගේ නමට පවරා නොගෙන ලබාදුන් ආයතනවල නමින්, පුද්ගල නමින් හා ලියාපදිංචි නොකරද පැවැතුණි.	වාහන 8 ක තොරතුරු වාහන පාලක ගේ අනුමැතිය සඳහා සම්පූර්ණ කරන ලද ලියකියවිලි සමඟ පළාත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. ලියාපදිංචි කිරීම් නොමැති අනෙකුත් වාහන සඳහා වවුනියාවේ මෝටර් රථ පරීක්ෂකවරයාගේ උපදෙස් සඳහා අපි ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තෙමු.	අයිතිය පැවරීමට පියවර ගත යුතුය.
(ඈ)	වවුනියා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ යතුරුපැදි දෙකක් නැතිවීම සහ යාපනය දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ භාණ්ඩ 282 ක් වර්ෂ 25 කට අධික කාලයක සිට අතුරුදහන් වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	1995 යුද්ධයේදී යාපනය දිස්ත්‍රික්කයේ අතුරුදහන් වූ භාණ්ඩ 280 ක් මාරු කිරීමට අදාළ ලියකියවිලි සොයාගෙන තිබේ.	මුදල් පනතට අනුව පියවර ගත යුතුය.
(ඉ)	රජයේ ප්‍රසම්පාදන අත්පොත් 5.3.10 මාර්ගෝපදේශය ප්‍රකාරව රු. මිලියන 2 සිට රු. මිලියන 5ක් දක්වා කාර්යයන් සඳහා ලංසුවල කල්ඉකුත් වීමේ දිනය දින 63කි. එසේ වූවත්, යාපනය කෘෂිකර්ම	අනාගතයේදී එවැනි වැරදි සිදුවීම වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.	ප්‍රසම්පාදන අත්පොතට අනුව ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

	දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 3.6ක්වූ කාර්යය සඳහා ලංසු වෙනුවෙන් කල් ඉකුත්වීමේ දිනය සඳහා අනුමැතියක් ලබානොගෙන දින 40ක් දක්වා අඩුකර තිබුණි. එසේම, කාර්යසාධන ඇපකරය ලබාගැනීමට ප්‍රථම 2023 නොවැම්බර් 29 දින ගිවිසුම්වලට එළැඹ තිබුණි.		
(ඊ)	වාර්ෂික පළාත් නිශ්චිත සංවර්ධන අරමුදලින් තේරාවිල් ගොවිපළ, මුලතිව් ගොවීන් සඳහා පුහුණු මධ්‍යස්ථානය සහ මන්නාරම පුහුණු කාර්යාලවලට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති යටතේ රු.7,433,835කට සවිකර තිබිය යුතු සූර්ය පැනල පද්ධති සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සවිකර ආදායම් ඉපැයීමට පියවර ගෙන නොතිබුණි.	මුලතිව් ගොවි පුහුණු මධ්‍යස්ථානයේ සහ මන්නාරම පුහුණු කාර්යාලයේ සූර්ය පැනල සවි කර ඇතත්, විදුලිබල මණ්ඩලය විසින් සම්බන්ධතා ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති අතර විදුලිබල මණ්ඩලයේ ප්‍රමාදය හේතුවෙන් සම්බන්ධතාවය ස්ථාපිත කර නොමැත. තවද, ථේරාවේ පුහුණු කාර්යාලයේ සූර්ය පැනලය දැනට භාවිතා වේ.	ව්‍යාපෘතිවලින් ආදායම් උපයා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(උ)	රජයේ බීජ නිෂ්පාදන ගොවිපලෙහි රු.2,767,000ක් වටිනා යන්ත්‍රෝපකරණ 19ක් භාවිතයට ගත නොහැකි මට්ටමේ පැවතුණි.	මෙම වසරේ PSDG වැඩසටහන සංශෝධන සඳහා වෙන් කර ඇත.	නිවැරදි කර භාවිතා කිරීමට පියවර ගත යුතුය.

1.5.19 ශීර්ෂය – 481 - පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩමේ අයිතිය පවරාගැනීමකින් තොරව රු. 93,480,086ක වටිනාකමකට පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.	එය පළාත් ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා යවා ඇත.	ඉඩම් අයිතිය අත්පත් කර ගැනීමට පියවර ගත යුතුය.

(ආ)	එකතුව රු.635,935ක් වටිනා ටැබ්ලට් (Tablet PC) 13ක් භාවිතයට නොගෙන ගබඩා කාමරයේ පැවැති අතර මේවා භාවිතා කිරීමට උතුරු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ඵලදායි පියවර ගෙන නොතිබුණි.	ඉහත ද්විත්වයන් වෙනත් සුදුසු දෙපාර්තමේන්තු වෙත මාරු කිරීමට පියවර ගෙන ඇත.	වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	එකතුව රු. 2,035,700ක් වටිනා ලැප්ටොප් පරිගනක 22ක් භාවිතයට නොගෙන ගබඩා කාමරයේ නිෂ්කාර්යව පැවැති අතර එසේම කාර්යාලයේ අභාවිතව පැවැති ලැප්ටොප් පරිගනක 39ක් අනෙකුත් රජයේ දෙපාර්තමේන්තුවලට නිකුත් කර තිබියදීත් සමාලෝචිත වර්ෂයේ ලැප්ටොප් පරිගනක 04ක් එකතුව රු.1,023,060කට උතුරු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන තිබුණි.	අපගේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ යාවත්කාලීන කරන ලද E Slim. GPS යන්ත්‍රය භාවිතයට තාක්ෂණිකව නුසුදුසු බව සොයා ගෙන ඇති බැවින්, පැරණි ලැප්ටොප් පරිගණක වෙනත් සුදුසු දෙපාර්තමේන්තු වෙත මාරු කිරීමට පියවර ගෙන ඇත.	වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	සිවිල් නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවූවත්, උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05 තුළ භාවිතයේ පවතින ඉඩම් සහ සංවර්ධනය නොකළ ඉඩම්වල ප්‍රමාණය සහ අනුමත කාර්ය මණ්ඩලය මත පදනම්ව සේවක මණ්ඩල බෙදා හැරීම සිදු කර නොතිබුණි. මේ නිසා වවුනියාව, මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල 6 සිට 19 දක්වා කාර්ය මණ්ඩල අවශ්‍යතාවයක් තිබුණද යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රාජකාරි නොවන හේතූන් මත 7 සිට 10 දක්වා කාර්ය මණ්ඩලය අතිරික්තව සේවයේ යෙදීමට ඉඩහැර තිබුණි.	වාර්ෂික ස්ථාන මාරුවීම් අතරතුර, අතිරික්ත කාර්ය මණ්ඩලය අවශ්‍ය තනතුරුවලට මාරු කිරීමට කටයුතු කරමින් පවතී.	කාර්ය මණ්ඩල කාර්යක්ෂමව යෙදවීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඉ)	උතුරු පළාත් රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු සඳහා සහ ව්‍යාපාර අරමුණු සඳහා ලබාදී ඔවුන් එකී ඉඩම් වලින් ආදායම් ඉපැයීමේ තත්ත්වයට පත්වූ පසුව 2019 සිට 2025 අප්‍රේල් 16 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.20,195,120ක හිඟබදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024.12.31 වන විට උතුරු පළාත් රජයේ ඉඩම්වල දිගුකාලීන බදු ගෙවීමේ හිඟ මුදල රු. 20,807,720 ක් වන අතර, එයින් රු. 651,100 ක් 2025 දක්වා අයකර ගෙන ඇති අතර, ඉතිරි රු. 20,156,620 අයකර ගැනීමට පියවර ගනිමින් පවතී.	හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය.

1.5.20 ශීර්ෂය 482 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනින්ජයන්කුලම රජයේ පශු සම්පත් අභිජනන ගොවිපලෙහි රු.1,706,157ක කිරි නිෂ්පාදන යන්ත්‍ර, විදුලි ජනකය සහ යන්ත්‍රෝපකරණ පසුගිය වර්ෂ 12ක සිට නිෂ්කාර්යව පැවති අතර එකී උපකරණ භාවිතයට ගැනීමේ අවස්ථාවන් පැවැති නමුත් රජයේ සම්පත් ඵලදායි අයුරින් භාවිතා කිරීමට විකල්ප ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අග්‍රාමාත්‍යවරයාගේ අවසරය පරිදි, ඉහත සංවිධානවල වත්මන් තත්ත්වය දැන ගැනීම සඳහා දැන් නැවතත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඔවුන්ගේ තීරණ ලැබුණු පසු, ඉහත සඳහන් දෑ එම සංවිධානවලට ලබා දීමට පියවර ගනු ලැබේ.	සම්පත් කාර්යාක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ආ)	යන්ත්‍රෝපකරණ නිෂ්පාදන ඒකකය වෙනුවෙන් ඉදිකළ රු.3,000,000ක ගොඩනැගිල්ල වර්ෂ 11ක සිට නිෂ්කාර්යව පැවැතුණි.	අනිවියන්කුලම්-පඩනිඩු කිරි ගොවිපල ගොඩනැගිල්ල ඉහත සඳහන් ගව අභිජනන සමුපකාර සංගමයට නිදහස් කිරීමට පියවර ගෙන ඇත.	සම්පත් කාර්යාක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	රු.5,695,000ක් වටිනා කුඩා ලොරි රථය සහ පොත්වලින් ඉවත් කර තිබූ රෝද හතරේ ට්‍රේලරය ගොවිපලෙහිම නිෂ්කාර්යව පැවැතුණි.	රියදුරන් හිඟය නිසා ඉහත සඳහන් බර වාහන භාවිතා කළ නොහැක. අනිංජියන්කුල ගව අභිජනන ගොවිපළේ බදුකරුවන්ට භාර දෙන අවස්ථාවේ සාදන ලද වාහනය දෙපාර්තමේන්තු භාවිතය සඳහා ගනු ලැබේ.	සම්පත් කාර්යාක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	වෙක්කඩිප්පුලවු එළු ගොවිපලෙහි මෙහෙයුම් කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ ද එකතුව රු.672,676 ක මුදලක් වැයකර තිබූ නමුදු රු.379,800ක ආදායමක් පමණක් උපයා ගෙන තිබුණි.	ඉහත සඳහන් අඩුපාඩු සපුරාලීම සඳහා වන ව්‍යාපෘතියක් මධ්‍යම පශු සම්පත් අමාත්‍යාංශයේ මූල්‍ය ආධාර මත දියත් කෙරේ. ඉහත ව්‍යාපෘති අවසන් වූ පසු ආදායම වැඩි කර ගැනීමට අවස්ථා ලැබෙනු ඇත.	සම්පත් කාර්යාක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඉ)	කුකුළු ගොවිපල මෙහෙයුම් කටයුතු 2015 සිට 2018 දක්වා කාල පරිච්ඡේදයේ සිදු කරන ලද අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කුකුළු ගොවිපල සඳහා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය	කුකුළු ගොවිපල දිගු කලක් භාවිතයට නොගෙන තිබුණද, එය භාවිතයට ගෙන ඒම සඳහා මූල්‍ය වර්ෂයේදී සංශෝධනයක් සිදු කරන ලදී, විදුලි සම්බන්ධතාවය සහ ආහාර සැපයීම සඳහා උපකරණ මිලදී ගත යුතු	සාධනීය ක්‍රියාමාර්ග ගත යුතුය.

	කිරීමේ කාර්යය සඳහා රු. 1,258,450ක් වැය කර තිබූ නමුත් වර්ෂ 06ක කාලයක් තිස්සේ කිසිදු ප්‍රගතියක් ලබා නොගෙන එය අත්හැර දමා තිබුණි.	බැවින්, මෙම වසරේ වැඩ අවසන් වූ පසු එය භාවිතයට ගනු ඇත.	
(ඊ)	එකතුව රු.2,484,251ක විවිධ ව්‍යාපෘති 05ක් සඳහා ලබාගත් තැන්පතුවල ව්‍යාපෘති කාලය අවසන් වී තිබූ නමුත් වාර්තා කරන දින වන විටත් උපයෝජනය කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	JICA මුදල රු. 905,271 ක් පශු වෛද්‍ය කාර්යාල වෙත මාසිකව ලැබෙමින් පවතී. JSB ව්‍යාපෘති ගෙවීම් 1,024,858 ක් සිදු කළ පසු, ඉතිරි මුදල ගිවිසුමට අනුව මෙහෙයුම් වියදම් සඳහා ආපසු ගෙවනු ලැබේ.	සම්පත් කාර්යාක්ෂමව භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(උ)	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු.4,911,000ක් වටිනා වාහන 02ක් අදාල කාල වකවානු තුළ අළුත්වැඩියා නොකිරීමෙන් වර්ෂ 05ක සිට නිෂ්කාර්යව පැවැතුණි.	අංක 05/2024 හි විධිවිධානවලට අනුකූලව, එන්ජින් ධාරිතාව වැඩිවීම සහ ආර්ථික වශයෙන් ආර්ථිකමය නොවන හේතූන් මත වාහන 02 ක් ඉවත් කිරීමට පියවර ගනිමින් පවතී.	හානි වූ වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඌ)	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සූර්ය පැනල සවිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ එකතුව රු.8,950,654ක් සලසා තිබූ නමුත්, එය නියමිත කාලය තුළ නිමකර නොතිබූ අතර, පසුගිය දින 132ක සිට ආදායම් උපයා ගැනීමේ අවස්ථා පළාත් සභාවට අහිමි වී තිබුණි.	සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මුළු රු. 8,950,654 ක් ගෙවා තිබුණද, කොන්ත්‍රාත්තුව අනුව 2024 නොවැම්බර් 01 වන දින අවසන් කිරීමට නියමිතව තිබූ කාර්යය නියමිත වේලාවට නිම නොකිරීම හේතුවෙන් පසුගිය දින 132 තුළ පළාත් සභාවට ආදායම් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	නිශ්චිත කාල සීමාව තුළ ආදායම් උත්පාදනය කිරීමට පියවර ගත යුතුය.

1.5.21 ශීර්ෂය – 490 - කර්මාන්ත දෙපාර්තමේන්තුව

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විවීම්/අත්යන්ත්‍ර මධ්‍යස්ථාන 12ක වර්ෂ 10කට පෙර වටිනාකමට රු.595,000ක් ගිණුම්ගත කර තිබූ අතර අදාළ ගොඩනැගිලිවල වර්තමාන වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.	තක්සේරු කළ යුතු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් 2025.04.21 දිනැති ලිපියක් මගින් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට මිල ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.	ගිණුම් වල ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.

(ආ)	නල්ලූර් උතුර විවීම්/අත්යන්ත්‍ර මධ්‍යස්ථානයේ පසුගිය වර්ෂය තුළදී එකදු අයෙකු හෝ පුහුණු කර නොතිබුණි. කන්දර්මඩම් මධ්‍යස්ථානයේ මෙහෙයුම් පිරිවැය ආසන්න වශයෙන් වර්ෂයක් සඳහා රු.930,418ක් පැවැති නමුත් අගෝස්තු මාසයෙන් පසුව කිසිදු අයෙකු සඳහා පුහුණුවක් ලබාදී නොතිබුණි.	විශේෂ නිෂ්පාදන සඳහා රෙදි වියන්නන් එකකට වඩා අවශ්‍ය වන බැවින්, ගෘහ රෙදි වියන්නන්ගේ ඉල්ලුමට අනුව රෙදි වියන්නන් භාවිතා කරනු ලැබේ. තවද, පුහුණුවන්නන් ලබා ගැනීමේ අභියෝග හේතුවෙන්, රෙදි වියන්නන් රෙදි වියන්නන්ට නිසි ලෙස සම්බන්ධ නොවේ.	සාධනීය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	2022 වර්ෂයේදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.700,000ක අත්යන්ත්‍ර උපකරණ 07ක් නිෂ්කාර්යව චුන්නාගම් ඩයි කිරීමේ මධ්‍යස්ථානයේ පැවැතුණි.	චුන්නාගම් ඩයි කිරීමේ කම්හලේ දැනට දක්නට ලැබෙන්නේ රෙදි වියන යන්ත්‍ර 3ක් පමණි. ඒවා ඌරුතුපුරම් රෙදි වියන මධ්‍යස්ථානයට භාර දීමට නියමිතය. ඉතිරි රෙදි වියන යන්ත්‍ර 04 රෙදි වියන මධ්‍යස්ථානවලට භාර දී ඇත.	භාවිතා කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	මූල්‍ය වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල එකතුව රු.1,218,263ක ගෙවීම් 26ක් මූල්‍ය වර්ෂයේ නොගෙවා හිඟහිටිව පැවැති නමුත් මෙම ගනුදෙනු කර්මාන්ත දෙපාර්තමේන්තුවේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ හෙලිදරව් කර නොතිබුණි.	ගෙවීම අවසර සහ වගකීමක් ලෙස මුදල් හෙළිදරව් කර නොමැත. මෙම කරුණ සලකා බලා අනාගතයේදී වගකීම හෙළිදරව් කිරීමට පියවර ගනු ලැබේ.	හෙළිදරව් කිරීමට පියවර ගත යුතුය.

1.5.22 උතුරු පළාත් සංචාරක කාර්යාංශය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
උතුරු පළාත් සංචාරක කාර්යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 15ක් වුවත්, ස්ථිර නිලධාරීන් පත්කර ආයතනය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට පළාත් සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සංචාරක කාර්යාලය ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාව ස්ථාපිත කෙරේ.	සාධනීය පියවර ගත යුතුය.

1.5.23 රජයේ සේවකයින්ගේ අත්තිකාරම් ගෙවීම් ගිණුම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශ 01ක් සහ දෙපාර්තමේන්තු 06ක සේවය කර වෙනත් ආයතනවලට ස්ථානමාරුවී ගිය, සේවය අත්හිටවූ, විශ්‍රාම ගිය සහ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් එකතුව රු. 2,376,457ක් සම්බන්ධයෙන් වර්ෂ 01 සිට 14ක් දක්වා කාලයක් සුදුසු ක්‍රියාමාර්ග පළාත් සභාව විසින් ගෙන නිරවුල් කර නොතිබුණි.	පිළිතුරක් ලබා දී නැත.	සාධනීය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.5.24 රජයේ සහනාධාරය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විවිධ ව්‍යාපෘති මගින් පළාත් සභාවට ලබාදුන් පරිත්‍යාග හා ප්‍රදානවලින් රු. මිලියන 2,386ක අරමුදල් ඌන උපයෝජනය කර තිබුණි.	පුනරාවර්තන වියදම් පාලනය කරන ලෙස ප්‍රධාන ගිණුම්කරණ නිලධාරීන්ට සහ ගිණුම්කරණ නිලධාරීන්ට උපදෙස් දී තිබුණි.	අයවැය අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය.

1.5.25 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ තක්සේරුකරු විසින් රු.100,000ක් වාර්ෂික බදු ලෙස මුහුදු කුඩැල්ලන් ගොවිපල්වලට නියම කළ මිල පළාත් ආණ්ඩුකාරවරයා විසින් රු.40,000කින් අඩුකිරිමෙන් පසුගිය වර්ෂ 03කින් පළාත් සභාවට රු. 113,465,101ක ආදායම් අහිමි වීම සිදුවී තිබුණි.	පළාත් ඉඩම් කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය වාර්තාව මත පදනම්ව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අක්කරයකට වාර්ෂික කල්බදු කුලිය රු. 100,000 සමාලෝචන ඉල්ලීම මත පදනම්ව සංශෝධිත මුදල තීරණය කරන ලද අතර ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලදී.	ආදායම අයකර ගැනීමට පියවර ගත යුතුය.

1.5.26 අනෙකුත් රාජ්‍ය ආයතනවලට සපයන ලද සම්පත් / බාහිර ආයතන සතු සම්පත්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාවට අයත් එකතුව රු. 59,800,000ක වාහන 03ක් වර්ෂ 02 සිට වර්ෂ 06කට අධික කාලයක් වෙනත් ආයතනවලට උපයෝජනය සඳහා ලබාදී තිබූ නමුත් එම ආයතනවලින් නැවත ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	සමාගම්වලින් වාහන 03 ආපසු අයකර ගැනීමට අඛණ්ඩ පියවර ගෙන ඇත.	වාහන කාර්යක්ෂමව යොදා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.